## සංක්ෂිප්තයෙන්

ලෝකයේ බොහෝ රටවල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළ ප්‍රාථමික අධ්‍යාපනයට සුවිශේෂත්වයක් හිමිවෙයි. ඇතැම් රාජ්‍ය ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්ය කර ඇත. ඇතැම් දුප්පත් රටවල ප්‍රාථමික අධ්‍යාපනය නැංවීමට ආධාර කරයි. මුළු ලෝකයේ ම මූලික දක්ෂතා සහ සාක්ෂරතාවය ලබාදීමේ අදියර ලෙස ප්‍රාථමික අධ්‍යාපන අදියර වැදගත් වේ. ශ්‍රී ලංකාවේ ද වයස අවු. 5 - 14 දක්වා අධ්‍යාපනය අනිවාර්ය කර ඇත. අධ්‍යාපනික සංවර්ධනයෙහිලා විෂයමාලා ප්‍රතිසංවිධානය, ගුරු වැටුප් ගෙවීම, පෙළපොත් මුද්‍රණය, ගුරු පුහුණු ආදී කටයුතු සඳහා වාර්ෂිකව දළ දේශීය නිෂ්පාදිතයෙන් 2% ක් වැය කරයි. එය ශ්‍රී ලාංකික සමාජ සංවර්ධනය ඉහළ නැංවීමටත්, අනාක්ෂරතාව පහළ දැමීමටත් කරන ආයෝජනයකි.

මෙම නිදහස් අධ්‍යාපනය තුළ ප්‍රාථමික අධ්‍යාපනය කෙළවර වන 5 ශ්‍රේණියේ සිසුන්ගේ කියවීමේ, ලිවීමේ සාධන මට්ටම් සහ එහි ගැටලු පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ තේමාව විය.

මෙම අධ්‍යයනයේ පළමු පරිච්ඡේදයෙන් ප්‍රාථමික අධ්‍යාපනයේ ස්වභාවය සහ ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ විවිධ ආයතනික හා පුද්ගලික නිර්වචන ද, මෙම අවධියේ අධ්‍යාපනය ලබන සිසුන්ගේ ස්වභාවය ද, භාෂාවේ වැදගත්කම සහ කියවීම, ලිවීම සම්බන්ධයෙන්ද නිර්වචනයන්ද, මෙම ගැටලුව අධ්‍යයනය කිරීමේ වැදගත්කම ද දක්වා ඇත. මෙම පරිච්ඡේදය අවසානයේ මාතර අධ්‍යාපන කලාපයේ අධ්‍යාපන පසුබිම පිළිබඳව තොරතුරු දක්වා ඇත.

දෙවන පරිච්ඡේදය තුළ සිසුන්ගේ කියවීම ලිවීම සම්බන්ධයෙන් සිදු කර ඇති විදේශීය හා දේශීය පර්යේෂකයන්ගේ පර්යේෂණ වල නිගමනයන් දක්වා ඇත. සිසුන්ගේ කියවීමේ ලිවීමේ දුෂ්කරතා ඇති වීම කෙරෙහි පවුල් පරිසරයේ බලපෑම මෙන්ම පාසල හා සම්බන්ධ සාධක ද මුල්වන බව දක්වා ඇත. පවුල් පරිසරය තුළ යහපත් සමාජ ආර්ථික පරිසරයක

ජීවත් වන සිසුන් පහළ සමාජ ආර්ථිකයක් සහිත සිසුන්ට වඩා අධ්‍යාපනයේ ප්‍රතිඵල ලබා ගන්නා බවත් දක්වා ඇත.

තුන්වන පරිච්ඡේදයෙන් පර්යේෂණ ක්‍රමවේදය යටතේ අධ්‍යයනයේ අරමුණු, නියැදිය, දත්ත රැස්කර ගන්නා ක්‍රමවේද හා අධ්‍යයනයේ සීමාවන් දක්වා ඇත.

හතරවන පරිච්ඡේදය මගින් මාතර අධ්‍යාපන කලාපයේ එක් අධ්‍යාපන කොට්ඨාසයකින් පාසල් 2 බැගින් කොට්ඨාශ හතරෙන් පාසල් 8 ක් තෝරා ගත්තේ එක් පාසල් වර්ගයකින්ද පාසල් දෙක බැගින් වන ලෙසය. එම පාසල් වලින් සිසුන් 240 කගේ නියැදියක් ඇසුරින් සිසුන්ගේ කියවීමේ ලිවීමේ දුෂ්කරතා පිළිබඳ විමර්ශනයට ලක්කර ඇත. එහිදී 5 ශ්‍රේණියේ සිසුන්ගේ කියවීමේ ලිවීමේ සාධන මට්ටම් සහ දුෂ්කරතා විමර්ශනයට ලක් කර ඇත. එම අපේක්ෂිත සාධන මට්ටම් වලට ළඟා වීමේදී පැන නඟින පවුල හා සමාජ පරිසරය සම්බන්ධ සාධකත්, පාසල හා සම්බන්ධ වූ සාධකත් විශ්ලේෂණය කර ඇත.

පස්වන පරිච්ඡේදයෙන් සිසුන්ගේ කියවීමේ ලිවීමේ දුෂ්කරතා පිළිබඳව එළඹි නිගමන ලෙස පාසල් වර්ගය අනුවද සිසුන්ගේ කියවීමේ, ලිවීමේ දුෂ්කරතා වල වෙනස්කම් දක්නට ලැබුණ බවත්, 1 AB පාසල් වල වුව ද සිටින කියවීමේ ලිවීමේ දුෂ්කරතා ඇති සිසුන් අයහපත් සමාජ පරිසර වලින් පැමිණෙන සිසුන් බවත් නිමනය කර ඇත. ඇතැම් පාසල් පිහිටි ප්‍රදේශ අනුව එම පාසල් වල පහත් සමාජ ආර්ථික මට්ටමකට ම සීමා වූ සිසුන් පමණක් ඉගෙනුම ලබන අතර මොවුන්ගේ සාධන මට්ටම සෑම අංශයකින් ම ඉතා පහත් අගයක් ගන්නා බැවින් මෙම සිසුන්ගේ සාධන මට්ටම ඉහළ නැංවීමට පාසලේ මැදිහත්වීම අවශ්‍ය බව දක්වා ඇත.